---

**හික්කඩුව නගර සභාව**

**ගාල්ල දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 15 දින ද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2012 ජූලි 09 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 ඔක්තෝබර් 17 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

## 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව හික්කඩුව නගර සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට හික්කඩුව නගර සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2000 දෙසැම්බර් 13 දිනැති අංක: 1162/12 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙන් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා විසින් හික්කඩුව නගර සභාව 2001 අප්‍රේල් 15 දින සිට ප්‍රකාශයට පත්කර තිබුණි. 2002 අප්‍රේල් 15 දින සිට ක්‍රියාත්මක වන පරිදි පූර්වයෙන් හික්කඩුව ප්‍රාදේශීය සභාව සතුව පැවති වත්කම් හා වගකීම් අතුරින් නගර සභාවට පැවරෙන කොටස නිශ්චිත වශයෙන් බෙදා වෙන් කිරීමක් විගණන දිනය වූ 2013 ජූලි 07 දින වනවිටත් සිදුකර නොතිබුණි.

(ආ) ආදායම් නිශ්චිතව හඳුනා නොගෙන හා විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා නොගෙන රු.60,313 ක් වූ වෙළඳ බලපත්‍ර ගාස්තු ආදායම් ජර්නල් සටහන් අංක 12 මඟින් කපාහැර තිබුණි.

(ඇ) ගිණුම් විෂයයන් 02 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.14,256,574 ක් වූ අතර, උපයෝගී ලේඛන අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.14,103,898 ක් වීමෙන් රු.152,676 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.86,435,164 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.9,711,141 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,566,095 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i) | වරිපනම් බදු | 10,400 | 5,587 | 9,243 |
| (ii) | බදුකුලී | 13,460 | 1,340 | 632 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,350 | 812 | 260 |
| (iv) | වෙනත් ආදායම් | 39,204 | 47,207 | 12,099 |

### 2.2.2 වරිපනම් බදු, බදුකුලී හා බලපත්‍ර ගාස්තු

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවල නගර සභාවට අයකර ගතයුතුව තිබූ රු.9,242,879 ක් වූ වරිපනම් බදු, රු.632,356 ක් වූ බදුකුලී හා රු.259,725 ක් වූ බලපත්‍ර ගාස්තු නගර සභා ආඥා පනතේ 170 වගන්තිය ප්‍රකාරව අය කරගෙන නොතිබුණි.

### 2.2.3 වෙළඳ බලපත්‍ර ගාස්තු

වෙළඳ බලපත්‍ර ගාස්තු අය කිරීම් සම්බන්ධව 2013 ජුනි 06 දින සිදුකළ ස්ථානීය පරීක්ෂාවේ දී සභා බලප්‍රදේශය තුළ ඉදිකර තිබූ දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 06 ක් වෙනුවෙන් 2012 වර්ෂය සඳහා රු.18,000 ක බලපත්‍ර ගාස්තු අය කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

### 2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 500,762 |
| (ii) | මුද්දර ගාස්තු | 9,010,800 |

---

**2.2.5 කඩ කාමර බදු**

හික්කඩුව නව දෙමහල් පොදු වෙළඳපොල බිම් මහල කඩ කාමර 64 ක් ද, මාළු කඩ 12 ක් ද ඇතුළුව කඩ කාමර 76 ක් පැරණි වෙළඳපොල කඩහිමියන් 63 කට සහ ටෙන්ඩර් කිරීම මගින් කඩ කාමර 13 ක් ද වශයෙන් 2012 වර්ෂයේ දී බදු දී තිබුණි. සභාව කඩහිමියන් සමග ඇතුළත් වූ ගිවිසුමේ කොන්දේසි අංක 30 අනුව කඩ කාමරවල රු.10,765,121 ක් වූ එක්වන් මුදල් මාස 06 ක් තුළ සමාන වාරික 06 කින් ගෙවා අවසන් කළ යුතුව තිබුණ ද, විගණන දිනය වූ 2013 ජුනි 06 දින වනවිට රු.4,653,191 ක එක්වන් මුදලක් හිඟව පැවතුණි. දේශීය ණය සහ සංවර්ධන අරමුදලෙන් ලබා ගන්නා ලද ණය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.3,578,895 ක් වූ ණය වාරික 18 ක් ගෙවිය යුතුව තිබුණි.

**2.3 අවිධිමත් ගනුදෙනු**

2005 ඔක්තෝබර් 05 දිනැති අංක 1413/15 දරන ශ්‍රී ලංකා ජනරජයේ අතිවිශේෂ ගැසට් නිවේදනයේ නියම කර ඇත්තා වූ දීමනාවලට අමතරව කාරක සභාවලට සහභාගීවීම වෙනුවෙන් මහජන නියෝජිතයන් 05 දෙනෙකු සහ නිලධාරීන් 05 දෙනෙකුට සමාලෝචිත වර්ෂයේදී රු.42,000 ක් ගෙවා තිබුණි.

**2.4 බැකෝ යන්ත්‍රයට අලාභහානි සිදුවීම**

2004 වර්ෂයේ දී සභාව විසින් රු.4,300,000 කට මිළට ගෙන තිබුණු බැකෝ යන්ත්‍රයට 2008 මාර්තු 24 දින අලාභ හානි සිදුව තිබුණි.

(අ) 2013 ජුනි 11 විගණන දින වනවිට යන්ත්‍රයට අලාභ හානි සිදුව වසර 05 ක් ඉක්ම ගොස් තිබුණ ද, ජනරජයේ මුදල් රෙගුලාසි 104(3) හා (4) අනුව අලාභ හානි පිළිබඳව වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) යන්ත්‍රය රු.1,253,385 කට අළුත්වැඩියා කිරීම සඳහා 2011 නොවැම්බර් 27 දින පුද්ගලික සමාගමකින් ඇස්තමේන්තුවක් ලබාගෙන තිබුණ ද, යන්ත්‍රයේ අළුත්වැඩියා කටයුතු 2013 ජුනි 11 දින දක්වා ම සිදුකර නොතිබුණි.

(ඇ) භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ 2004 අගෝස්තු 31 දිනැති අංක 353(5) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1.2 වගන්තිය අනුව තක්සේරු කිරීම හා අවම

වෙන්දේසි මිළ නියම කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් නම් කරන ලද ඉංජිනේරුවරයෙක් / තාක්ෂණික නිලධාරියෙක් සහ තක්සේරු දෙපාර්තමේන්තුවේ නිලධාරියෙක් ඇතුළු සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත තක්සේරු මණ්ඩලයක් නම්කර ඒ අනුව කටයුතු කළයුතු වුවත්, දකුණු පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික ඉංජිනේරු විසින් යන්ත්‍රය වෙන්දේසි කිරීමට රු.1,200,000 කට අවම ලංසුවක් නියම කර තිබුණි.

## 2.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

2010 මාර්තු 10 දිනැති හා අංක : PF/R/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි

## 2.6 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂයට අදාල අභ්‍යන්තර විගණන වැඩ සටහන් සහ අභ්‍යන්තර විගණන පරීක්ෂණ වාර්තා විගණනය වෙත ඉදිරිපත් නොවුණි.

## 3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය